## 52

ඔබ තෝරාගත් ඔබගේ රජයේ
අපි රාජ්‍ය ජනතාවයි
ඔබ කැඳවාලූ ඔබ සේවාවේ
අපි පූජක ජනතාවයි
ඔබෙන් වරම් ලද ඔබගේ වචනේ
අපි දිවැසියෙ ජනතාවයි

සියල් පැවැත්මෙහි පැවැත්මයාණනි
ඔබේ ශ්‍රී නාමෙට හෝසානා
රජය ද බලය ද මහිමෙ ද ඔබගෙයි
ඔබේ ශ්‍රී නාමෙට – හෝසානා ////

විශ්ව විජය ලද විශ්ව සමිඳු සෙවනේ
විශ්වාසයේ ජනතාවයි
අතින්ද්‍රිය කිතු සමිඳුගේ සිරි සිරුරේ
අපි ප්‍රේමයේ ජනතාවයි
සග දිව්යෙන් බැඳි බලාපොරොත්තුවෙහි
සසග අපි පෙරමග ජනතාවයි